**මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2014**

මගේ අංකය:- CPC/PSC/5
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.
2014.01.17 වැනි දින.

**මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

---

2013.09.23 දිනැතිව නිකුත් කර ඇති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2013 හි විධිවිධාන මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට 2007.02.02, 2007.12.03, 2008.06.16 හා 2008.12.03 දිනැතිව පත්වීම් ලද නිලධාරීන්ට පහත සඳහන් පරිදි අදාළ කරගැනීම මධ්‍යම පලාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත. ඒ අනුව මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත පරිදි නොපැවැත්වීම මත එම කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා පත්වීම් දින සිට පවත්වන ලද අනුගාමී විභාග වාර 04 ක් දක්වා පහත සඳහන් පරිදි සහන ලබාදීම අනුමත කර ඇත.

| විභාග අවස්ථාව | පත්වීම් දිනය | සහනය ලබාදීමට සලකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන් | පත්වීම් දිනය | සහනය ලබාදීමට සලකා බලනු ලබන විභාග පැවැත්වූ දිනයන් |
|---|---|---|---|---|
| 1 | 2007.02.02, 2007.12.03 | 2008.08.30 | 2008.06.16, 2008.12.03 | 2009.07.26 |
| 2 | | 2009.07.26 | | 2010.07.17 |
| 3 | | 2010.07.17 | | 2011.10.01 |
| 4 | | 2011.10.01 | | 2013.01.27 |

02. මේ අනුව උක්ත දිනයන්හි පත්වීම් ලත් නිලධාරීන් අදාළ විභාග වාර 04 ඇතුලත කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන්නේ නම් වැටුප් වර්ධක විලම්භනය නොවන අතර, සෙසු නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කරන දිනය දක්වා පරිවාස කාලය දීර්ඝ වේ.

03. ඉහත 02 හි පරිදි කාර්යක්ෂමතා කඩඉම සමත්ව මේ වන විට වැටුප් වර්ධක විලම්භනය කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ පරිවාස කාලය සංශෝධනය කිරිම සඳහා ආයතන ප්‍රධානියා මගින් ඉල්ලීම් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

04. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ /ආයතනයේ ඒ සඳහා සුදුසුකම් ලබන සියළුම නිලධාරීන්ට දැනගැනීමට සැලැස්විය යුතුය.

ආර්.එම්.එන්.රත්නායක
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

www.psc.cp.gov.lk